වාර්ෂික කාර්යසාධන වාර්තාව **2023**

வருடாந்த செயலாற்றுகை அறிக்கை 2023

ANNUAL PERFORMANCE REPORT 2023



ණය සහනදායක මණ්ඩලයීය දෙපාර්තමේන්තුව

கடன் இணக்க சபைத் திணைக்களம்

DEPARTMENT OF DEBT CONCILIATION BOARD

වාර්ෂික කාර්යසාධන වාර්තාව

வருடாந்த செயலாற்றுகை அறிக்கை

ANNUAL PERFORMANCE REPORT

2023

ණය සහනදායක මණ්ඩලයීය දෙපාර්තමේන්තුව

கடன் இணக்க சபைத் திணைக்களம்

DEPARTMENT OF DEBT CONCILIATION BOARD

2023 වර්ෂය සඳහා වාර්ෂික කාර්ය සාධන වාර්තාව

ණය සහනදායක මණ්ඩලයීය දෙපාර්තමේන්තුව

වැය ශීර්ෂ අංකය 231

අන්තර්ගතය

පරිච්ඡේදය 01 - ආයතනික පැතිකඩ / ක්‍රියාවට නැංවීමේ සාරාංශය

පරිච්ඡේදය 02 - ප්‍රගතිය හා ඉදිරි දැක්ම

පරිච්ඡේදය 03 - වසරේ සමස්ථ මූල්‍ය කාර්ය සාධනය

පරිච්ඡේදය 04 - කාර්ය සාධන දර්ශක

පරිච්ඡේදය 05 - තිරසාර සංවර්ධන අරමුණු (SDG) සපුරා ගැනීමේ කාර්ය සාධනය

පරිච්ඡේදය 06 - මානව සම්පත් පැතිකඩ

පරිච්ඡේදය 07 - අනුකූලතා වාර්තාව

01 පරිච්ඡේදය - ආයතනික පැතිකඩ / ක්‍රියාවට නැංවීමේ සාරංශය

1.1 හැඳින්වීම

ඉඩකඩම්, කුඹුරු, වතුපිටි නිවාස නිශ්චල දේපල පොරොන්දු සින්නක්කර ඔප්පු, උකස්කර ඔප්පුවක් මත ඇපයට තබාගත් ණය සම්බන්ධයෙන් හෝ එවැනි ආරක්ෂිත ණයක් සම්බන්ධයෙන් ණයගැතිවී ඇති මහජනතාව එම ණයගැතිභාවයෙන් මුදවාලීම සඳහා කිසියම් සහනදායී ක්‍රියා මාර්ගයක් හඳුන්වාදීම අරමුණ කරගෙන 1941 අංක 39 දරණ සහනදායක ආඥාපනත යටතේ මෙම දෙපාර්තමේන්තුව පිහිටුවන ලදි. මීට අමතරව 1999 දී කරන ලද අංක 29 දරණ සංශෝධන පනතට අනුව හුදෙක් ණය ගනුදෙනුවක් සඳහාම ලියන ලද සින්නක්කර ඔප්පු සම්බන්ධයෙන් මණ්ඩලයට මැදිහත් වී සහන සැලැස්වීමට හැකිවීමෙන් මෙම සහනදායී ක්‍රියාමාර්ගය තවත් පුළුල් වී ඇත. මෙම මණ්ඩලයේ ක්‍රියාකාරිත්වය මඟින් මුදල් හිමියන් විසින් අත්තනෝමතික ලෙස ණය ගැතියන් ගසාකනු ලැබීමට ඇති ඉඩකඩ අසුරනු ලබයි. මණ්ඩලයේ මූලික පරමාර්ථය මෙය වුවද එමඟින් ණයහිමියන්ටද අසාධාරණයක් සිදුවීමට ඉඩ නොතබයි. උකස් ඔප්පු පිට හා පොරොන්දු සින්නක්කර ඔප්පු පිට බැඳී ඇති නිශ්චල දේපල පිළිබඳව ණයකරුට පහසුවන්නා වූත් ණයහිමි පිළිගන්නුවූත් කොන්දේසි මත එම දේපල බේරා ගැනීමට උපකාර කිරීම මෙම මණ්ඩලයේ පරමාර්ථයයි. මෙම මණ්ඩලයට ඉදිරිපත් කරනු ලබන අයදුම්පත්‍ර සඳහා කිසිම ගාස්තුවක් අය නොකෙරෙන අතර, මණ්ඩලයේ කටයුතු මුද්දර ගාස්තුවලින් තොරව ඉටු කරනු ලැබේ. ගැසට් හා නොතීසි ගාස්තු වශයෙන් අයකරනු ලබන්නේ ඉතා සුළු මුදලත් බැවින් ණය බරින් මිරිකී සිටින ජනතාවට මෙමඟින් ලැබී ඇති සේවය අති විශාලය. එසේම තමා වෙනුවෙන් මණ්ඩලය ඉදිරියේ නීතිඥයින් ඉදිරිපත් කිරීම අනිවාර්ය නොවන බැවින් මහජනතාවට සිදුවන සේවය ඉමහත්ය.

2019 අංක 04 දරණ ණය සහනදායක (සංශෝධිත) පනත අනුව ණය සහනදායක මණ්ඩලය අමාත්‍යවරයා විසින් පත් කරනු ලබන සාමාජිකයින් 11 දෙනෙකුගෙන් සමන්විත වන අතර, මණ්ඩලයේ සභාපතිවරයා මහාධිකරණ විනිසුරුවරයෙකු ලෙස හෝ දිසා අධිකරණ විනිසුරුවරයෙකු ලෙස විනිශ්චයකාර ධූරයක් දරනු ලබන හෝ දරා ඇති තැනැත්තෙකු හෝ, නීතීඥවරයෙකු ලෙස අවුරුදු පහළොවකට නොඅඩු වන්නා වූ වෘත්තීය අත්දැකීම් සහිත තැනැත්තෙකු විය යුතුය.

මණ්ඩලයේ අනෙකුත් සාමාජිකයන් දසදෙනා -

- නීතිඥවරයෙකු ලෙස අවුරුදු පහළොවකට නොඅඩු වෘත්තිය පළපුරුද්ද සහිත හෝ,
- ශ්‍රී ලංකා පරිපාලන සේවයේ හෝ දීප ව්‍යාප්ත සේවකයක I වන ශ්‍රේණියේ ධූරයක තනතුරක් දරනු ලබන හෝ දරා ඇති තැනැත්තන් විය යුතුය
- වාණිජ ක්ෂේත්‍රයේ පලපුරුදු අයෙකු

අමාත්‍යවරයා විසින් නිශ්චය කරනු ලැබීය හැකි පරිදි අමාත්‍යවරයා විසින් පත්කරනු ලබන සභාපතිවරයෙකුගෙන් හා හතරදෙනෙකු නොඉක්මවන්නා වූ හා දෙදෙනෙකුට නොඅඩු වන්නා වූ වෙනත් සාමාජියන් සංඛ්‍යාවකින් සෑම ශාඛා මණ්ඩලයක්ම සමන්විය විය යුතුය.

- සෑම ශාඛා මණ්ඩලයකම සභාපතිවරයා මණ්ඩලයේ සාමාජිකයෙකු විය යුතු අතර, මහාධිකරණ විනිසුරුවරයෙකු ලෙස හෝ දිසා අධිකරණ විනිසුරුවරයෙකු ලෙස විනිශ්චයකාර ධූරයක් දරනු ලබන හෝ දරා ඇති තැනැත්තකු හෝ
- නීතිඥවරයෙකු ලෙස අවුරුදු පහළොවකට නොඅඩු වෘත්තිය අත්දැකීම් සහිත තැනැත්තෙකු විය යුතුය.

සෑම ශාඛා මණ්ඩලයකම අනෙකුත් සාමාජිකයන්

- නීතීඥවරයෙකු ලෙස අවුරුදු දහයකට නොඅඩු වෘත්තිය අත්දැකීම් සහිත හෝ,
- ශ්‍රී ලංකා පරිපාලන සේවයේ හෝ දීපව්‍යාප්ත සේවයක I ශ්‍රේණියේ ධූරයක තනතුරක් දරන හෝ දරා ඇති තැනැත්තන්ගෙන් සමන්විත යුතුය.

මෙම මණ්ඩලයේ රාජකාරි කටයුතු සාමාන්‍ය අධිකරණයක පවත්නා ස්වරූපයට වඩා වෙනස් ස්වරූපයක් ගනී. මණ්ඩලය විසින් ඉදිරියේ එළැඹෙන ගිවිසුම් පාර්ශවකරුවන් ඔවුනොවුන් කැමැත්තෙන් එළැඹෙන ගිවිසුම් මිස මණ්ඩලයේ විධාන ක්‍රියාත්මක කිරීමක් නොවේ. එසේ වුවද අසාධාරණ පොළී ප්‍රමාණයන් අඩු කිරීමටද මණ්ඩලය විසින් ඉදිරිපත් කරනු ලබන සාධාරණ යෝජනා ණය හිමියන් විසින් පිළිනොගන්නේ නම් ඒ සම්බන්ධයෙන් ආඥාපනත යටතේ ණයකරුවන්ට සහතිකයක් නිකුත් කිරීමටද මණ්ඩලයට බලතල ඇත. එසේම ණයහිමි පාර්ශවය අවසාන විභාගය සඳහා නිකුත් කළ නොතීසීය පරිදි විභාගයට නොපැමිණියහොත් ඒකපාර්ශවික නඩු විභාගයකින් අනතුරුව ණයකරු වෙත සහතිකයක් නිකුත් කෙරේ. එහෙත් එසේ කරනු ලබන්නේ ලියාපදිංචි තැපෑලෙන් හා ග්‍රාම නිලධාරි තැන මඟින් අවස්ථානෝචිත පරිදි ණයහිමි වෙත දැනුම්දී ණයහිමි පාර්ශවය හිතාමතාම විභාගයට පැමිණීම පැහැර හරින්නේ යැයි මණ්ඩලයට නිශ්චිත ලෙස ඒත්තු ගියහොත් පමණි. මෙබඳු අවස්ථාවකදි එවැනි සහතිකයක් නිකුත් කිරීමෙන් ඇතිවන වාසිය ණයකරු සතු වේ. වෙනත් අධිකරණයක් මේ පිළිබඳව විභාගයක් පැවත්වෙන අවස්ථාවකදි මෙම සහතිකය එම අධිකරණය වෙත ඉදිරිපත් කරනු ලැබුවහොත් ණය මුදල බේරුම් කිරීම සඳහා වසර 10 ක උපරිමයකට යටත්ව කාල සීමාවක් ලබාදීමටත් පොළිය අවම අනුපාතය දක්වා අඩුකිරීමටත් නඩු ගාස්තු කිසිවක් ණයකරුගෙන් අයකර නොගැනීමටත් ණය සහනදායක ආඥාපනත යටතේ අධිකරණයට බලතල ලබාදී ඇත.

1.2 ආයතනයේ දැක්ම, මෙහෙවර, අරමුණු

මෙහෙවර

උකස්කරයක්, පොරොන්දු සින්නක්කරයක් හෝ හුදෙක් ණය ගණුදෙනුවක් සඳහාම සින්නක්කර ඔප්පු සම්බන්ධව ගත් මුදලක් ඇපයට බැඳී ඇති කෘෂිකාර්මික හෝ ගේ දොර, ඉඩකඩම් ආදී වූ නිශ්චල දේපලක් ණය සහනදායී අන්දමට වාරික මඟින් හා අඩු පොළී අනුපාතයට ගෙවා නිදහස් කරගැනීමට ණයකරුවන්ට අවශ්‍ය නීතිමය රැකවරණය හා සහන සලස්වා දීම

දැක්ම

නිශ්චල දේපළ සම්බන්ධයෙන් වූ ණය ගණුදෙනුවලින් පීඩාවට පත්වූ මහජනයාට ණය බරින් නිදහස් වීමට සහනදායී වැඩපිළිවෙළක් සලසාදීම.

අරමුණු


නිශ්චල දේපල සම්බන්ධයෙන් උකස්කර පොරොන්දු සිනක්කරයක් හා හුදෙක් ණය ගණුදෙනුවක් සඳහාම ලියන ලද සින්නක්කර හා අනෙකුත් බැඳීම් කෙරෙහි අය විය යුතු ණය පිළිබඳව සම්මුතිවලට පාර්ශවයන් පැමිණවීම.

1.3 ප්‍රධාන කාර්යයන්

ඉඩකඩම්, කුඹුරු, වතුපිටි, නිවාස වැනි නිශ්චල දේපල පොරොන්දු සින්නක්කර ඔප්පු, උකස්කර ඔප්පුවක් මත ඇපයට තබාගත් ණය සම්බන්ධයෙන් හෝ එවැනි ආරක්ෂිත ණයක් සම්බන්ධයෙන් ණය ගැතිවී මහජනතාව එම ණයගැතිභාවයෙන් මුදවාලීම සඳහා කිසියම් සහනදායී ක්‍රියාමාර්ගයක් හඳුන්වාදීම අරමුණු කරගෙන 1941 අංක 39 දරණ ණය සහනදායක ආඥාපනත යටතේ මෙම දෙපාර්තමේන්තුව පිහිටුවන ලදි. මීට අමතරව 1999 දී කරන ලද අංක 29 දරණ සංශෝධන පනතට අනුව හුදෙක් ණය ගණුදෙනුවක් සඳහාම ලියන ලද සින්නක්කර ඔප්පු සම්බන්ධයෙන් මණ්ඩලයට මැදිහත් වී සහන සැලැස්වීමට හැකිවීමෙන් මෙම සහනදායී ක්‍රියාමාර්ගය තවත් පුළුල් වී ඇත. මෙම මණ්ඩලයේ ක්‍රියාකාරිත්වය මඟින් ණය හිමියන් විසින් අත්තනෝමතික ලෙස ණයගැතියන් ගසාකනු ලැබීමට ඇති ඉඩකඩ අසුරනු ලබයි. මණ්ඩලයේ මූලික පරමාර්ථය මෙය වුවද එමඟින් ණයහිමියන්ට අසාධාරණයක් සිදුවීමට ඉඩ නොතබයි. උකස් ඔප්පු පිට හා පොරොන්දු සින්නක්කර ඔප්පු පිට බැඳී ඇති නිශ්චල දේපළ පිළිබඳ ණයකරුට පහසුවන්නාවූත් ණයහිමි පිළිගනු ලබන්නාවූත් කොන්දේසි මත එම දේපළ බේරා ගැනීමට උපකාර කිරීමට මෙම මණ්ඩලයේ පරමාර්ථයයි.

මෙම මණ්ඩලයට ඉදිරිපත් කරනු ලබන අයදුම්පත සඳහා කිසිම ගාස්තුවක් අය නොකෙරෙන අතර මණ්ඩලයේ කටයුතු මුද්දර ගාස්තුවලින් තොරව ඉටුකරනු ලැබේ. ගැසට් හා නොතීසි ගාස්තු වශයෙන් අයකරනු ලබන්නේ ඉතා සුළු මුදලක් බැවින් ණය බරින් මිරිකී සිටින ජනතාව මෙමඟින් ලැබී ඇති සේවය අති විශාලය. තමා වෙනුවෙන් මණ්ඩලය ඉදිරියේ නීතීඥයන් ඉදිරිපත් කිරීම අනිවාර්ය නොවන බැවින් මහජනතාව සිදුවන සේවය ඉමහත්ය.

1.4 සංවිධාන සටහන


දෙපාර්තමේන්තුවේ ලේකම්
ගණකාධිකාරී
ප්‍රධාන කළමනාකරණ සේවා නිලධාරී
ද්විතියික මට්ටම
ප්‍රාථමික මට්ටම
සංවර්ධන නිලධාරී
කළමනාකරණ සේවා නිලධාරීන්
ලඝු ලේඛක නිලධාරීන්
රියදුරු
කාර්යාල සේවක සේවයේ නිලධාරීන්

ණය සහනදායක මණ්ඩලයේ සාමාජිකයන්

නම	තනතුර	**2019**අංක **4** දරණ ණය සහනදායක **(සංශෝධිත)** ආඥාපනතෙහි **2** වන උපවගන්තිය අනුව අයත්වන සේවය
ණය සහනදායක මණ්ඩලය		
1. ඩබ්ලිව්.අයිරාංගනී පෙරේරා මිය	සභාපති	විශ්‍රාමලත් මහාධිකරණ විනිසුරු
2. කුසුම් සෙනරත් පතිරණ මිය	සාමාජික	විශ්‍රාමලත් කම්කරු විනිශ්චය සභා සභාපති / අතිරේක මහේස්ත්‍රාත්
3. ඩබ්ලිව්.සී.පුෂ්පමාලි මිය	සාමාජික	විශ්‍රාමලත් මහාධිකරණ විනිසුරු
4. කේ.ඒච්.ප්‍රේමදාස මයා	සාමාජික	විශාමලත් බැංකු නිලධාරී
5. කේ.පී.බන්දුල රන්ජිත් මයා	සාමාජික	නීතීඥ සහ නොතාරිස්
කොළඹ ණය සහනදායක මණ්ඩලය		
1. පියසේන රණසිංහ මයා	සභාපති	විශ්‍රාමලත් මහාධිකරණ විනිසුරු
2. පද්මා පලිහක්කාර මිය	සාමාජික	විශ්‍රාමලත් මහාධිකරණ විනිසුරු
3. එම්.ඒ.මිල්ටන් මාරසිංහ මයා	සාමාජික	නීතීඥ
4. සරත් චන්ද්‍රසිරි විතාන මයා	සාමාජික	ශ්‍රී ලංකා පරිපාලන සේවයේ විශ්‍රාමික (විශේෂ ශ්‍රේණිය)
5. සෝමපාල කරුණාතිලක මයා	සාමාජික	විශ්‍රාමලත් විදුහල්පති
ගම්පහ ණය සහනදායක මණ්ඩලය		
1. පියසීලි වික්‍රමසිංහ මතුරට මිය	සභාපති	විශ්‍රාමලත් මහාධිකරණ විනිසුරු
2. නන්දිනී රණවක මිය	සාමාජික	විශ්‍රාමික පාර්ලිමේන්තු නියෝජ්‍ය අධ්‍යක්ෂ (පාලන)
3. ඩී.එම්.කරුණාරත්න මයා	සාමාජික	ශ්‍රී ලංකා පරිපාලන සේවයේ විශ්‍රාමික
ගාල්ල ණය සහනදායක මණ්ඩලය		
1. මහින්ද පිණිදිය මයා	සභාපති	විශ්‍රාමලත් මහාධිකරණ විනිසුරු
2. කේ.පී.ඩී.ජයන්ත ගුණරත්න මයා	සාමාජික	නීතීඥ
3. ජී.පී.පියසේන මයා	සාමාජික	විශ්‍රාමලත් බැංකු නිලධාරී

කුරුණෑගල ණය සහනදායක මණ්ඩලය		
1. ආර්.එම්.පි.එස්.කේ.රත්නායක මයා	සභාපති	විශ්‍රාමලත් මහාධිකරණ විනිසුරු
2. ජේ.ජී.එන්.තිලකරත්න මයා	සාමාජික	විශ්‍රාමික පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂ
3. විමලා සේනානායක මිය	සාමාජික	නීතීඥ සහ නොතාරිස්

02 පරිච්ඡේදය - ප්‍රගතිය හා ඉදිරි දැක්ම

2023.01.01 සිට 2023.12.31 දක්වා ණය සහනදායක මණ්ඩලයේ කාර්ය සාධනය

විස්තරය	සංඛ්‍යාව
2023.01.01 දිනට ඉදිරියට ගෙනා නොනිමි ඉල්ලුම්පත් සංඛ්‍යාව	1124
වර්ෂය තුළ ලැබූ නව ඉල්ලුම්පත් සංඛ්‍යාව	580
සමාලෝචනය සඳහා හා නිෂ්ප්‍රභා ඉල්ලීම් සඳහා ලැබුණු ඉල්ලුම්පත් සංඛ්‍යාව	89
ප්‍රධාන ශාඛාව වෙත සහ ශාඛා මණ්ඩල වෙත ලද අයදුම්පත් සංඛ්‍යාව	18
මුළු ඉල්ලුම්පත් සංඛ්‍යාව	1811
සමථයට පත්කල ඉල්ලුම්පත් සංඛ්‍යාව	335
නිෂ්ප්‍රභා කළ ඉල්ලුම්පත් සංඛ්‍යාව	190
සමාලෝචනය කළ ඉල්ලුම්පත් සංඛ්‍යාව	93
සහතික නිකුත් කළ ඉල්ලුම්පත් සංඛ්‍යාව	41
ඉල්ලා අස්කරගත් ඉල්ලුම්පත් සංඛ්‍යාව	70
රෝලෙන් ඉවත් කරන ලද ඉල්ලුම්පත් සංඛ්‍යාව	81
පසෙක තබන ලද ඉල්ලුම්පත් සංඛ්‍යාව	2
ශාඛා මණ්ඩල වෙත යවන ලද ඉල්ලුම්පත් සංඛ්‍යාව	16
අවසන් කරන ලද අයදුම්පත් සංඛ්‍යාව	273
පියවර ගත් මුළු ඉල්ලුම්පත් සංඛ්‍යාව	1101
ඉතිරි අයදුම්පත් සංඛ්‍යාව	710
මුදල් ගෙවීම සඳහා නැවත කැඳවන අයදුම්පත් සංඛ්‍යාව	202
2023.12.31 දිනට නිවැරදිකිරීම්	245
2023.12.31 දිනට අවසන් නොවී ඉතිරි වූ ඉල්ලුම්පත් සංඛ්‍යාව	**1157**

- 2023 වර්ෂයේදී අවසන් කරන ලද අයදුම්පත් සංඛ්‍යාව මුළු අයදුම්පත් සංඛ්‍යාවෙන් 49% ක ප්‍රතිශතයකි.

<u>දිස්ත්‍රික් වශයෙන් ලද අයදුම්පත් සංඛ්‍යාව</u>

2023.01.01 දින සිට 2023.12.31 දින දක්වා

දිස්ත්‍රික්කය	**2023.12.31** දිනට ඉදිරිපත් කර ඇති අයදුම්පත් සංඛ්‍යාව
කොළඹ	58
කළුතර	66
කුරුණෑගල	82
කෑගල්ල	28
රත්නපුර	20
බදුල්ල	02
අම්පාර	00
ගාල්ල	82
මාතර	30
හම්බන්තොට	13
ගම්පහ	144
මහනුවර	28
පුත්තලම	15
මාතලේ	10
අනුරාධපුරය	01
නුවරඑළිය	01
එකතුව	**580**

ශාඛා මණ්ඩලය	**2023.01.01.** දිනට ශාඛා සතුව පවතින ඉල්ලුම්පත් සංඛ්‍යාව	වර්ෂය තුළ ලද අයදුම්පත් සංඛ්‍යාව	**2023.12.31** දිනට අවසන් කරන ලද ඉල්ලුම්පත් සංඛ්‍යාව	**2023.12.31** දිනට ඉතිරි වී ඇති නඩු සංඛ්‍යාව
ප්‍රධාන මණ්ඩලය	170	229	237	162
කොළඹ ශාඛා මණ්ඩලය	183	166	190	159
ගාල්ල ශාඛා මණ්ඩලය	197	175	160	212
ගම්පහ ශාඛා මණ්ඩලය	278	360	255	383
කුරුණෑගල ශාඛා මණ්ඩලය	296	204	259	241
එකතුව	**1124**	**1134**	**1101**	**1157**

මූල්‍ය ප්‍රගතිය

වැය විෂය	2023 වර්ෂය සඳහා ප්‍රතිපාදන (රු මි.)	2023.12.31 දිනට වියදම (රු මි.)	2023.12.31 දිනට මූල්‍ය ප්‍රගතිය (%)
ප්‍රාග්ධන වියදම	0.90	0.58	64.63%
පුනරාවර්තන	76.60	60.39	79.11%
එකතුව	77.50	61.00	79%

දෙපාර්තමේන්තුවේ ඉදිරි දැක්ම

ණය සහනදායක මණ්ඩල මේ වන විට කොළඹ 08, ආචාර්ය එන්.එම්. පෙරේරා මාවතෙහි අංක 35 ඒ දරණ ස්ථානයෙහි පවත්වාගෙන යනු ලබන අතර දිවයිනේ සෑම දිස්ත්‍රික්කයකින්ම පාහේ ණයසහනදායක මණ්ඩලයේ සහනපත්‍රා දෛනිකව කොළඹට පැමිණෙන මහජනතාවගේ පහසුව සඳහා දෛනිකව ලැබෙන අයදුම්පත් සංඛ්‍යාව වැඩිවීම හේතුවෙන්, මහජනතාව වෙත කාර්යක්ෂමව සේවාව සැපයීම සඳහාත්/ ණය සහනදායක මණ්ඩලයේ සේවාව දීප ව්‍යාප්ත කිරීමේ අරමුණින් 2019 අංක 04 දරණ ණය සහනදායක (සංශෝධිත) පනත අනුව ශ්‍රී ලංකා ණය සහනදායක මණ්ඩලය ලෙස පුළුල් කරන ලදි.

ඒ අනුව, ණය සහනදායක මණ්ඩලය සඳහා දෛනිකව ලැබෙන අයදුම්පත් අනුව වැඩි වශයෙන් අයදුම්පත් ඉදිරිපත් වන දිස්ත්‍රික්ක සැලකිල්ලට ගනිමින් ගාල්ල , කොළඹ සහ ගම්පහ දිස්ත්‍රික්ක කේන්ද්‍ර කර ගනිමින් ශාඛා මණ්ඩල පිහිටුවන ලදි. තවද උතුර, උතුරු මැද, වයඹ සහ මධ්‍යම පළාත් ද ආවරණය වන ලෙස කුරුණෑගල දිස්ත්‍රික්කය කේන්ද්‍ර කර ගනිමින් ශාඛා මණ්ඩලයක් ද පිහිටුවා ඇත. ඒ අනුව ශ්‍රී ලංකා ණය සහනදායක මණ්ඩලයේ සේවාව ඉතා කාර්යක්ෂම සහ ඵලදායී අයුරින් මහජනතාව වෙත ලබාදීමට බලාපොරොත්තු වෙමු.

රාජ්‍ය ගිණුම් කාරකසභාවේ යෝජනාව පරිදි ඉදිරියේදී මධ්‍යම සහ සබරගමුව පළාත් ආවරණය වන පරිදි ශාඛා මණ්ඩල පිහිටුවීමට සැලසුම් සකස් කරමින් පවතී.

සුභාෂිණී දයානන්ද
ලේකම්
ණය සහනදායක මණ්ඩලයීය දෙපාර්තමේන්තුව

02 පරිච්ඡේදය - 2023 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ වසර සඳහා වන සමස්ත මූල්‍ය කාර්ය සාධනය

3.1 මූල්‍ය කාර්ය සාධන ප්‍රකාශය

2023 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා
මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය

සංශෝධිත අයවැය ප්‍රතිපාදන 2023 රු.		සටහන	කෘත්‍ය 2023 රු.	2022 රු.	
-	ආදායම් ලැබීම්		-	-	
-	ආදායම් බදු	1	-	-	
-	දේශීය භාණ්ඩ හා සේවා මත බදු	2	-	-	ඒසිඒ-1
-	ජාත්‍යන්තර වෙළඳාම මත බදු	3	-	-	
-	බදු නොවන ආදායම් හා වෙනත්	4	-	-	
-	මුළු ආදායම් ලැබීම් (අ)		-	-	
-	ආදායම් නොවන ලැබීම්		-	-	
-	භාණ්ඩාගාර අග්‍රිම		59,854,000	45,612,000	ඒසිඒ-3
-	තැන්පතු		116,454	86,486	ඒසිඒ-4
-	අත්තිකාරම් ගිණුම්		1,076,517	1,640,697	ඒසිඒ-5
	වෙනත් ප්‍රධාන ලෙජර් ගිණුම් ලැබීම්		-	-	
-	මුළු ආදායම් නොවන ලැබීම් (ආ)		**61,046,971**	47,339,183	
-	මුළු ආදායම් ලැබීම් සහ ආදායම් නොවන ලැබීම් ඇ = (අ)+(ආ)		**61,046,971**	47,339,183	
	භාණ්ඩාගාරයට ප්‍රේෂණ (ඇ)		233,684	8,741	
	ශුද්ධ ආදායම් ලැබීම් සහ ආදායම් නොවන ලැබීම් ඉ = (ඇ)-(ඇ)		60,813,287	47,330,442	
	අඩු කළා : වියදම්				
-	පුනරාවර්තන වියදම්		-	-	
45,500,000	වැටුප්, වේතන සහ අනෙකුත් සේවක ප්‍රතිලාභ	5	34,337,031	21,642,644	
31,000,000	අනෙකුත් භාණ්ඩ හා සේවා	6	26,023,106	15,237,069	ඒසිඒ-2(ii)
100,000	සහනාධාර, ප්‍රදාන සහ මාරුකිරීම්	7	30,484	32,179	
-	පොළී ගෙවීම්	8	-	-	
-	වෙනත් පුනරාවර්තන වියදම්	9	-	-	

Scanned with CamScanner

76,600,000	මුළු පුනරාවර්තන වියදම් (ඊ)		60,390,622	36,911,892	
	මූලධන වියදම්				
	මූලධන වත්කම් පුනරුත්ථාපනය හා				
300,000	වැඩිදියුණු කිරීම්	10	-	-	
500,000	මූලධන වත්කම් අත්පත් කර ගැනීම්	11	493,470	89,990	
-	ප්‍රාග්ධන මාරුකිරීම්	12	-	-	ඒසිඒ-2(ii)
-	මූල්‍ය වත්කම් අත්පත් කර ගැනීම	13	-	-	
100,000	හැකියා වර්ධනය	14	90,000	11,000	
-	වෙනත් මූලධන වියදම්	15	-	-	
900,000	මුළු මූලධන වියදම් (උ)		583,470	100,990	
	තැන්පතු ගෙවීම්		111,179	86,486	ඒසිඒ-4
	අත්තිකාරම් ගෙවීම්		1,067,800	1,885,583	ඒසිඒ-5
	වෙනත් ප්‍රධාන ලෙජර් ගිණුම් ගෙවීම්		-	-	
	ප්‍රධාන ලෙජර් වියදම් (ඌ)		1,178,979	1,972,069	
	මුළු වියදම් එ = (ඊ+උ+ඌ)		62,153,070	38,984,951	
-	දෙසැම්බර් 31 දිනට ශේෂය ඒ = (ඉ-එ)		(1,339,783)	8,345,491	
	අග්‍රිම ගැලපුම් ප්‍රකාශනය අනුව ශේෂය		(1,339,783)	8,345,491	ඒසිඒ-7
	දෙසැම්බර් 31 දිනට අග්‍රිම ශේෂය		-	-	ඒසිඒ-3

Scanned with CamScanner

2023 දෙසැම්බර් 31 දිනට
මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශනය

	සටහන	තක්ෂ 2023 රු.	2022 රු.
මූල්‍ය නොවන වත්කම්			
දේපළ, පිරියත හා උපකරණ	ඒසිඒ-6	11,716,119	11,012,649
මූල්‍ය වත්කම්			
අත්තිකාරම් ගිණුම්	ඒසිඒ-5/5(ඒ)	2,488,903	2,497,620
මුදල් හා මුදල් සමාන දෑ	ඒසිඒ-3	-	-
මුළු වත්කම්		**14,205,022**	**13,510,269**
ශුද්ධ වත්කම් / ස්කන්ධය			
භාණ්ඩාගාරය වෙත ශුද්ධ වත්කම්		2,488,903	2,497,620
දේපළ පිරියත හා උපකරණ සංචිතය		11,716,119	11,012,649
කුලී හා වැඩ අත්තිකාරම් සංචිතය	ඒසිඒ-5(බී)		
ප්‍රංගම වගකීම්			
නැන්පතු ගිණුම්	ඒසිඒ-4		-
අග්‍රිම ශේෂය	ඒසිඒ-3	-	-
මුළු වගකීම්		**14,205,022**	**13,510,269**

පිටු අංක 08 සිට 26 දක්වා ඒසිඒ 1 සිට ඒසිඒ 7 දක්වා වූ ආකෘති පත්‍රවලින් ඉදිරිපත් කෙරෙන ගිණුම් තොරතුරු සහ ඇමුණුම් පිටු අංක 27 සිට 32 දක්වා ඇතුළත් ගිණුම් සටහන් විස්තර ද මෙම අවසන් ගිණුමෙහිම අන්තගර්ත කොටස් වේ. මෙම මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම පොදුවේ පිළිගත් ගිණුම් මූලධර්මවලට අනුකූලව සිදුකර ඇති අතර මෙහිදී මූල්‍ය ප්‍රකාශනයන්හි සටහන් මගින් හෙළිදරව් කර ඇති පරිදි වඩාත් සුදුසු ගිණුම්කරණ ප්‍රතිපත්ති භාවිත කර ඇත. ඉහත අවසන් ගිණුමෙහි සඳහන් සංඛ්‍යා, ඊට අදාළ ගිණුම් සටහන් හා අනෙකුත් ගිණුම් තොරතුරු භාණ්ඩාගාර ගිණුම් පොත් සමඟ සැසඳීම් කර ඇති බවටත් ඒවා එම සංඛ්‍යා සමඟ එකඟ වන බවටත් මෙයින් සහතික කරමු.

මූල්‍ය පාලනය සඳහා ඵලදායී අභ්‍යන්තර පාලන පද්ධතියක් ව්‍යාතර්කරණ ආයතනය තුළ පවතින බවත් මූල්‍ය පාලනය සඳහා අභ්‍යන්තර පාලන පද්ධතියේ සඵලතාවය අධීක්ෂණය කිරීමටත් ඒ අනුව එම පද්ධති ඵලදායී ලෙස ක්‍රියාත්මක කිරීමට අවශ්‍ය පරිදි වෙනස් කිරීම් සිදුකිරීමට වරින් වර සමාලෝචන සිදුකරන බවත් මෙයින් සහතික කරමු.

.....	D.S. Dayananda.	.....
ප්‍රධාන ගණන්දීමේ නිලධාරි	ගණන්දීමේ නිලධාරි	ප්‍රධාන මූල්‍ය නිලධාරි/ප්‍රධාන ගණකාධිකාරි/
නම : එම්. එන්. රණසිංහ	නම : සුභාෂිණී දයානන්ද	අධ්‍යක්ෂ (මූදල්)/ කොමසාරිස් (මූදල්)
තනතුර : ලේකම්, අධිකරණ, බන්ධනාගාර කටයුතු හා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා ප්‍රතිසංස්කරණ අමාත්‍යාංශය	තනතුර : ලේකම්, ණයසහනදායක මණ්ඩලයීය දෙපාර්තමේන්තුව	නම : ජී.ටී.ඊ. දිල්රුක්ෂි
දිනය : 2024.02.27	දිනය : ලේකම්	දිනය : 2024/02/26

ලේකම්
අධිකරණ, බන්ධනාගාර කටයුතු හා
ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා ප්‍රතිසංස්කරණ අමාත්‍යාංශය
නො. 19, ශ්‍රී සංඝරාජ මාවත,
කොළඹ 10.

ණය සහනදායක මණ්ඩලයීය දෙපාර්තමේන්තුව
අංක 35 ඒ, ආචාර්ය එදිරිවීර සරච්චන්ද්‍ර මාවත,
කොළඹ 08.
2024.02.26

ජී.ටී.ඊ. දිල්රුක්ෂි
ගණකාධිකාරි (වැ.බ.)
ණය සහනදායක මණ්ඩලයීය දෙපාර්තමේන්තුව
අංක 35, ඒ. ආචාර්ය එදිරිවීර සරච්චන්ද්‍ර මාවත,
කොළඹ 08.

Scanned with CamScanner

2023 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා
මුදල් ප්‍රවාහ ප්‍රකාශනය

	තක්ෂ	
	2023 රු.	2022 රු.
මෙහෙයුම් ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහයන්		
මුළු බදු ලැබීම්	-	-
ගාස්තු, අධිභාර, දඩමුදල් සහ බලපත්‍ර	-	-
ලාභ	-	-
ආදායම් නොවන ලැබීම්	-	-
වෙනත් ආදායම් ශීර්ෂ වෙනුවෙන් එකතු කරන ලද ආදායම්	1,524,252	1,059,159
අග්‍රිම ලැබීම්	59,854,000	45,612,000
අත්තිකාරම් අයකර ගැනීම්	909,397	1,724,537
තැන්පතු ලැබීම්	116,454	86,485
මෙහෙයුම් ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහය (අ)	**62,404,103**	**48,482,181**
අඩුකළා : මුදල් වැය කිරීම්		
පුද්ගල පඩිනඩි හා මෙහෙයුම් වියදම්	60,129,986	36,874,912
සහනාධාර සහ මාරුකිරීම්	30,484	32,179
වෙනත් වැය ශීර්ෂ වෙනුවෙන් දරන ලද වියදම්	247,500	9,740,367
භාණ්ඩාගාරයට පියවන ලද අග්‍රිම	233,684	8,741
අත්තිකාරම් ගෙවීම්	1,067,800	1,638,507
තැන්පතු ගෙවීම්	111,179	86,485
මෙහෙයුම් ක්‍රියාකාරකම් සඳහා වැය කරන ලද මුදල් ප්‍රවාහය (ආ)	**61,820,633**	**48,381,191**
මෙහෙයුම් ක්‍රියාකාරකම්වලින් ජනිත වූ ශුද්ධ මුදල් ප්‍රවාහය (ඇ)=(අ)-(ආ)	**583,470**	**100,990**
ආයෝජන ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහයන්		
පොළී	-	-
ලාභාංශ	-	-

Scanned with CamScanner

භිමිකම් ඉවත්වීමේ ප්‍රතිපාදන හා භෞතික වත්කම් විකිණීම	-	-
උපණය අයකර ගැනීම්	-	-
ආයෝජන ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහය (ඇ)	-	-
අඩුකළා : මුදල් වැය කිරීම්		
මූලධන වියදම්	583,470	100,990
ආයෝජන ක්‍රියාකාරකම් සඳහා වැය කරන ලද මුළු මුදල් ප්‍රවාහය (ඉ)	583,470	100,990
ආයෝජන ක්‍රියාකාරකම්වලින් ජනිත වූ ශුද්ධ මුදල් ප්‍රවාහය (ඊ)=(ඇ)-(ඉ)	(583,470)	(100,990)
මෙහෙයුම් හා ආයෝජන ක්‍රියාකාරකම්වලින් ජනිත වූ ශුද්ධ මුදල් ප්‍රවාහය (උ)=(ඇ) + (ඊ)	(0.0)	-
මූල්‍ය ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහයන්		
දේශීය ණය ගැනීම්	-	-
විදේශීය ණය ගැනීම්	-	-
ප්‍රදානයන් ලැබීම්	-	-
මූල්‍ය ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුළු මුදල් ප්‍රවාහය (ඌ)	-	-
අඩුකළා : මුදල් වැය කිරීම්		
දේශීය ණය ආපසු ගෙවීම්	-	-
විදේශීය ණය ආපසු ගෙවීම්	-	-
මූල්‍ය ක්‍රියාකාරකම් සඳහා වැය කරන ලද මුළු මුදල් ප්‍රවාහය (එ)	-	-
මූල්‍ය ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහය (ඒ)=(ඌ)-(එ)	-	-
මුදල්වල ශුද්ධ වෙනස්වීම් (ඔ) = (උ)+(ඒ)	-	-
ජනවාරි 01 දිනට ආරම්භක මුදල් ශේෂය	-	-
දෙසැම්බර් 31 දිනට අවසාන මුදල් ශේෂය	-	-

Scanned with CamScanner

පාඩු හා අත්හැරීම් පිළිබඳ ප්‍රකාශනය

(මු.රෙ. 106 හා මු.රෙ. 113 යටතේ වන පාඩු)

වියදම් ශීර්ෂ අංකය: 231 දෙපාර්තමේන්තුවේ නම : ණය සහනදායක මණ්ඩලයීය දෙපාර්තමේන්තුව

වැඩසටහන් අංකය හා නාමය : 01 - මෙහෙයුම් වැඩසටහන්

(i) වර්ෂය තුළ අලාභ අයකර ගැනීම/කපාහැරීම/අත්හැරීම් පිළිබඳ ප්‍රකාශය

අගය		සිද්ධි සංඛ්‍යාව	මුළු එකතුව (රු)
රු 25,000.00	අඩු	නැත	නැත
රු 25,000.01	වැඩි	නැත	නැත
එකතුව		නැත	නැත

අලාභයේ ස්වභාවය අනුව සිද්ධි වර්ගීකරණය	සිද්ධි සංඛ්‍යාව	අගය (රු)
1	නැත	නැත
2	නැත	නැත
3	නැත	නැත
4	නැත	නැත
එකතුව	නැත	නැත

(ii) තවදුරටත් අයකර ගැනීමට හෝ කපා හැරීමට හෝ අත්හැරීමට ඇති පාඩු පිළිබඳ ප්‍රකාශය

අගය		සිද්ධි සංඛ්‍යාව	මුළු එකතුව (රු)
රු 25,000.00	අඩු	නැත	නැත
රු 25,000.01	වැඩි	නැත	නැත
එකතුව		නැත	නැත

අලාභයේ ස්වභාවය අනුව සිද්ධි වර්ගීකරණය	සිද්ධි සංඛ්‍යාව	අගය (රු)
1	නැත	නැත
2	නැත	නැත
3	නැත	නැත
4	නැත	නැත
එකතුව	නැත	නැත

(ii) අනුව කාල විශ්ලේෂණය

වසර 5 ට අඩු	සිද්ධි සංඛ්‍යාව	නැත
	ගණන	රු
වසර 5-10	සිද්ධි සංඛ්‍යාව	නැත
	ගණන	රු
වසර 10 ට වැඩි	සිද්ධි සංඛ්‍යාව	නැත
	ගණන	රු

සටහන - වැය විෂය 1701 යටතේ වර්ෂය තුළ ගිණුම්ගත කරන ලද හෝ ඉදිරි වර්ෂවලදී ගිණුම්ගත කිරීමට අපේක්ෂිත මු.රෙ. 106 යටතේ වන හානි හා මු.රෙ 113 යටතේ වන අත්හැරීම් පිළිබඳ විස්තර ඇතුළත් කළ යුතු ය.

.....

ප්‍රධාන මූල්‍ය නිලධාරි/ ප්‍රධාන ගණකාධිකාරි/
අධ්‍යක්ෂ (මුදල්) /කොමසාරිස් (මුදල්)
දිනය : 2024/02/24

ඒ.ඩී.ඒ. දල්රුක්ෂි
ගණකාධිකාරි (වැ.ඩ.)
ණය සහනදායක මණ්ඩලයීය දෙපාර්තමේන්තුව
අංක 35, ඒ. ආචාර්ය එන්.එම්.පෙරේරා මාවත
කොළඹ 08.

Scanned with CamScanner

Cumulative Commitment/ Liability Report for the Year - 2023

To		Printed by	Safa
(231)		New Table No	:SA-92
From		Old Table No	:--
Director General, , **Department of State Accounts, ,**		Report Date	2/21/2024 11:43:05 AM
General Treasury, Colombo1. .			

NEW CIGAS 2023 FINAL 2023 REPORTS

This is a computer-generated document. No signature is required.

Report Generated by the new CIGAS Web Application--Developed by S.Tharshan -Director, Dept of State Accounts.

-

Scanned with CamScanner

බැරකම් පිළිබඳ ප්‍රකාශනය - (i)

මු.රෙ.94 (2) සහ (3) ප්‍රකාරව බැරකම්වලට එළඹෙන ලද බැඳීම් ප්‍රකාශනය

දෙපාර්තමේන්තුවේ නම : ණය සහනදායක මණ්ඩලයීය දෙපාර්තමේන්තුව
වියදම් ශීර්ෂ අංකය: 231
වැඩසටහන් අංකය හා නාමය: 01- මෙහෙයුම් වැඩසටහන

පුද්ගලයාගේ/ආයතනයේ නම	බැඳීම් පිළිබඳ විස්තරය	ව්‍යාපෘතිය	උප ව්‍යාපෘතිය	වැය විෂය සංකේතය	මූල්‍යකරණ සංකේතය	මු.රෙ. 94(2) හි සඳහන් ප්‍රතිපාදන අනුව එළඹිය හැකි උපරිම බැඳීම් සීමාව (රු.)	මු.රෙ. 94(3) අනුව මුළ පිරිවැය ඇස්තමේන්තුව (රු.)	බැඳීම් හා බැරකම් වටිනාකම (රු.)
1. අමාත්‍යාංශ/රජයේ දෙපාර්තමේන්තු								
එකතුව								
2. රාජ්‍ය සංස්ථා /ව්‍යවස්ථාපිත මණ්ඩල								
ලංකා විදුලිබල මණ්ඩලය	විදුලි බිල්පත් ගෙවීම්	231	1	1403	11	998,780.00		1,695.38
ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලය	ජල බිල්පත	231	1	1403	11	998,780.00		10,780.17
ශ්‍රී ලංකා ටෙලිකොම් පී. ඒල්.සී	දුරකතන බිල්පත්	231	1	1402	11	645,000.00		26,500.10
සීමාසහිත රක්නා ආරක්ෂක ලංකා	ආරක්ෂක සේවා	231	1	1409	11	2,168,186.00		249,461.53
එකතුව								288,437.18
3. වෙනත් (පෞද්ගලික අංශය)								
අනිකාල දීමනා - ඩී.එච්. ටී.ටී. සිල්වා ඇතුළු පිරිස	දෙපාර්තමේන්තුව නිලධාරීන්ගේ අනිකාල දීමනා	231	1	1002	11	197,500.00		25,217.00
ගමන් වියදම් - ජී. ඒ. නිලක	දෙපාර්තමේන්තුව නිලධාරීන්ගේ ගමන් වියදම්	231	1	1101	11	126,667.00		3,150.00
එකතුව								28,367.00
මුළු එකතුව								316,804.18

ප්‍රධාන මූල්‍ය නිලධාරී/ ප්‍රධාන ගණකාධිකාරී/
අධ්‍යක්ෂ (මුදල්) /කොමිසාරිස් (මුදල්)
දිනය : 30 2024/02/24

ජී.ටී.ඩී. දිල්රුක්ෂි
ගණකාධිකාරී (වැ.ඛ.)
ණය සහනදායක මණ්ඩලයීය දෙපාර්තමේන්තුව
අංක 35, ඒ. ආචාර්ය එන්.එම්.පෙරේරා මාවත
කොළඹ 08

Scanned with CamScanner

3.2 ආදායම් එකතුකිරීමේ කාර්ය සාධනය

රු.

ආදායම් සංකේතය	ආදායම් කේතයේ විස්තරය	ආදායම් ඇස්තමේන්තුව		එකතු කරන ලද ආදායම	
		මුල් ඇස්තමේන්තුව	අවසන් ඇස්තමේන්තුව	ප්‍රමාණය (රු.)	අවසාන ආදායම් ඇස්තමේන්තුවේ % ලෙස
20.02.02.99	පොලිය - අනෙකුත්	90,000	90,000	109,395.29	121.55 %
20.03.99.00	විකුණුම් සහ ගාස්තු අනෙකුත් ලැබීම්	250,000	250,000	724,109.10	289.64 %
20.06.02.02	වෙනත්	780,000	780,000	690,748.07	88.55 %

3.3 වෙන් කරන ලද ප්‍රතිපාදන උපයෝගී කරගැනීමේ කාර්ය සාධනය

රු.

ප්‍රතිපාදන වර්ගය	වෙන් කරන ලද ප්‍රතිපාදන		තත්‍ය වියදම	උපයෝගි කරනු ලැබූ ප්‍රතිපාදන අවසන් කරන ලද අවසාන ප්‍රතිපාදන ප්‍රමාණයේ % ලෙස
	මූල්‍ය ප්‍රතිපාදන	අවසාන ප්‍රතිපාදනය		
පුනරාවර්තන	76,600,000	76,600,000	60,390,622	79%
ප්‍රාග්ධන	900,000	900,000	583,470	65%

3.4 මු.රෙ 208 ප්‍රකාරව, වෙනත් අමාත්‍යාංශ දෙපාර්තමේන්තුවල නියෝජිතයෙකු ලෙස මෙම දෙපාර්තමේන්තුවට/ දිස්ත්‍රික් ලේකම් කාර්යාලයට/ පළාත් සභාවටම ප්‍රධානය කරන ලද ප්‍රධාන ප්‍රතිපාදන

අනු අංකය	ප්‍රතිපාදන අමාත්‍යාංශය/ දෙපාර්තමේන්තුව	ප්‍රතිපාදනයේ අරමුණ	ප්‍රතිපාදන	තත්‍ය වියදම	උපයෝගි කරගන්නා ලද ප්‍රතිපාදන ලබා අවසාන ප්‍රතිපාදනවල % ලෙස
අදාල නොවේ					

3.5 මූල්‍ය නොවන වත්කම් වාර්තා කිරීමේ කාර්ය සාධනය

රු.

වත්කම්	කේත විස්තරය	2023.12.31 දිනට භාණ්ඩ සමීක්ෂණ වාර්තාව අනුව ශේෂය	2023.12.31 දිනට මූල්‍ය තත්ත්ව වාර්තාව අනුව ශේෂය	ඉදිරියේදී ගිණුම්කරණයට නියමිත	ප්‍රගතිය % ලෙස වාර්තා කිරීම
9152	යන්ත්‍රෝපකරණ	11,716,118.97	11,716,118.97	-	100%

3.6. විගණකාධිපතිවරයාගේ වාර්තාව

ජාතික විගණන කාර්යාලය
தேசிய கணக்காய்வு அலுவலகம்
NATIONAL AUDIT OFFICE

මගේ අංකය / எனது இல. / My No. } JLO/A/DDCB/FA/2023/41 මගේ අංකය / உமது இல. / Your No. }

දිනය / திகதி / Date } 2024 මැයි 29 දින

04 JUN 2024

ලේකම්

ණය සහනදායක මණ්ඩලයීය දෙපාර්තමේන්තුව

ශීර්ෂය -231, ණය සහනදායක මණ්ඩලයීය දෙපාර්තමේන්තුවේ 2023 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(1) වගන්තිය ප්‍රකාරව විගණකාධිපති සම්පිණ්ඩන වාර්තාව

යථෝක්ත වාර්තාව හා මූල්‍ය ප්‍රකාශනයේ භාෂාත්‍රයෙන් වූ සහතික කරන ලද පිටපත මේ සමඟ එවා ඇත.

ආර්.එස්. කටුගම්පල
ජ්‍යෙෂ්ඨ සහකාර විගණකාධිපති
විගණකාධිපති වෙනුවට

පිටපත : 1.අධ්‍යක්ෂ ජනරාල් - රාජ්‍ය ගිණුම් දෙපාර්තමේන්තුව

Scanned with CamScanner

No. 306/72, Polduwa Road, Battaramulla, Sri Lanka.
+94 11 2 88 70 28 - 34 +94 11 2 88 72 23 ag@auditorgeneral.gov.lk www.naosl.gov.lk

ජාතික විගණන කාර්යාලය
தேசிய கணக்காய்வு அலுவலகம்
NATIONAL AUDIT OFFICE

මගේ අංකය / எனது இல. / My No. JLO/A/DDCB/FA/2023/41 ඔබේ අංකය / உமது இல. / Your No. දිනය / திகதி / Date 2024 මැයි 29 දින

ලේකම්

ණය සහනදායක මණ්ඩලයිය දෙපාර්තමේන්තුව

ශීර්ෂය 231 - ණය සහනදායක මණ්ඩලයිය දෙපාර්තමේන්තුවේ 2023 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(1) වගන්තිය ප්‍රකාරව විගණකාධිපති සම්පිණ්ඩන වාර්තාව.

1. මූල්‍ය ප්‍රකාශන

1.1 තත්ත්වාගණනය කළ මතය

ශීර්ෂය 231 - ණය සහනදායක මණ්ඩලයිය දෙපාර්තමේන්තුවේ 2023 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය හා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ ප්‍රමාණාත්මක ගිණුම්කරණ ප්‍රතිපත්තිවලට අදාළ තොරතුරු ද ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන්වලින් සමන්විත 2023 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන, 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(1) වගන්තිය ප්‍රකාරව දෙපාර්තමේන්තුව වෙත ඉදිරිපත් කරනු ලබන මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ සඳහන් වේ. ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 10 වගන්තිය ප්‍රකාරව ඉදිරිපත් කළ යුතු විගණකාධිපති වාර්තාව යථා කාලයේදී පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කරනු ලැබේ.

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2023 දෙසැම්බර් 31 දිනට ණය සහනදායක මණ්ඩලයිය දෙපාර්තමේන්තුවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය කාර්ය සාධනය හා මුදල් ප්‍රවාහය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

Scanned with CamScanner

No. 306/72, Polduwa Road, Battaramulla, Sri Lanka.
+94 11 2 88 70 28 - 34 +94 11 2 88 72 23 ag@auditorgeneral.gov.lk www.naosl.gov.lk

1.2 **තත්ත්වාගණනය කළ මතය මතය සඳහා පදනම**

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ. ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් මාගේ වගකීම විගණකගේ වගකීම යන වගන්තියේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබා ගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

1.3 **මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ හා ගණන්දීමේ නිලධාරීගේ වගකීම**

පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව හා 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 38 වගන්තියේ සඳහන් විධිවිධානවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිඹිබු කෙරෙන පරිදි මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම හා වංචා සහ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම ගණන්දීමේ නිලධාරීගේ වගකීම වේ.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) වගන්තිය ප්‍රකාරව දෙපාර්තමේන්තුව විසින් වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වා ගෙන යා යුතුය.

ජාතික විගණන පනතේ 38(1)(ඇ) උප වගන්තිය ප්‍රකාරව දෙපාර්තමේන්තුවේ මූල්‍ය පාලනය සඳහා සඵලදායි අභ්‍යන්තර පාලන පද්ධතියක් සකස් කර පවත්වා ගෙන යනු ලබන බවට ගණන්දීමේ නිලධාරී සහතික විය යුතු අතර එම පද්ධතියේ සඵලදායිත්වය පිළිබඳව කලින් කල සමාලෝචනයක් සිදු කර ඒ අනුව පද්ධතිය ඵලදායි ලෙස කරගෙන යාමට අවශ්‍ය වෙනස්කම් සිදු කරනු ලැබිය යුතුය.

1.4 **මූල්‍ය ප්‍රකාශන විගණනය පිළිබඳ විගණකගේ වගකීම**

සමස්ථයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා හා වැරදි හේතුවෙන් ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සෑම විටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් අනාවරණය කර ගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇති විය හැකි

Scanned with CamScanner

අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කර ගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රදා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම් හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම් ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.
- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබා ගන්නා ලදී.
- මෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය සහ අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව ඇගැයීම.
- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ මෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ත ඉදිරිපත් කිරීම අගයන ලදී.

මාගේ විගණනය තුළදී හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව ගණන්දීමේ නිලධාරී දැනුවත් කරමි.

1.5 වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාර්තාව

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6(1)(ආ) වගන්තිය ප්‍රකාරව පහත සඳහන් කරුණු මා ප්‍රකාශ කරමි.

(අ) මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වන බවට,

(ආ) ඉකුත් වර්ෂයට අදාළ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මා විසින් කර තිබුණු නිර්දේශ ක්‍රියාත්මක කර තිබුණි.

Scanned with CamScanner

1.6 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

1.6.1 තැන්පතු ගෙවීම

තැන්පතු ගිණුම් ශේෂය භාණ්ඩාගාර මුද්‍රිත සටහන් SA 30 අනුව රු.5,275 ක් වුවද, මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශයේ 2023 දෙසැම්බර් 31 දිනට ජංගම වගකීම් යටතේ තැන්පතු ගිණුම් ශේෂයක් නොදැක්වීම හේතුවෙන් ජංගම වගකීම් රු.5,275 ක් අඩුවෙන් දක්වා තිබුණි.

1.6.2 මූල්‍ය නොවන වත්කම්

2023 ජනවාරි 19 වන දින අධිකරණ අමාත්‍යාංශයේ බන්ධනාගාර අංශයෙන් ප්‍රින්ටරයක් ලබා ගෙන තිබුණු අතර, මූල්‍ය නොවන වත්කම් ප්‍රකාශයේ මාරු කිරීම් යටතේ රු. 75,000 ක් ලෙස සටහන් නොකර එය වර්ෂය ආරම්භක ශේෂයේ එකතු කිරීම් යටතේ පෙන්වා තිබුණි.

1.6.3 ශුද්ධ වත්කම්/ස්කන්ධය

රාජ්‍ය ගිණුම් මාර්ගෝපදේශයේ 7.8 ඡේදයේ සඳහන් උපදෙස් අනුව වාර්තා කරන ආයතනයේ අත්තිකාරම් ගිණුම්වල වටිනාකමෙන් තැන්පතු ගිණුම්වල වටිනාකම අඩු කිරීමෙන් මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශයේ ශුද්ධ වත්කම්/ ස්කන්ධය යටතේ ඇති "භාණ්ඩාගාරය වෙත ශුද්ධ වත්කම්" ලෙස දැක්විය යුතු වුවද, තැන්පතු ගිණුම් ශේෂය නොදැක්වීම හේතුවෙන් භාණ්ඩාගාරය වෙත ශුද්ධ වත්කම් රු. 2,488,903 ක් ලෙස රු. 5,275 ක් අඩුවෙන් දක්වා තිබුණි.

2. මූල්‍ය සමාලෝචනය

2.1 වියදම් කළමනාකරණය

(අ) අධි ප්‍රතිපාදන සලසා ගැනීම හේතුවෙන් පුනරාවර්තන වැය විෂයයන් 11 ක් සඳහා වූ රු.67,400,000 ක් වූ මුළු ශුද්ධ ප්‍රතිපාදනයෙන් රු. 15,183,681 ක් ඉතිරි වී තිබුණු අතර එම ඉතිරිය සියයට 06 සිට සියයට 100 දක්වා පරාසයක් ගෙන තිබුණි.

(ආ) එක් මූලධන වැය විෂයයක් සඳහා ප්‍රතිපාදිත රු. 300,000 ක් වූ සම්පූර්ණ ප්‍රතිපාදනයම ඉතිරි වී තිබුණි.

2.2 බැරකම් හා බැදීම්වලට එළඹීම

1403 වැය විෂයයෙහි බැරකම් වටිනාකම රු. 84,270 ක් වුවද, රු. 12,475 ක් ලෙස රු. 71,795 ක් අඩුවෙන් මූල්‍ය ප්‍රකාශනයේ සටහන් (iv) හි බැරකම් පිළිබඳ ප්‍රකාශයේ දක්වා තිබුණි.

Scanned with CamScanner

3 මෙහෙයුම් සමාලෝචනය

3.1 කාර්යසාධනය

3.1.1 අපේක්ෂිත නිමවුම් මට්ටම් ලබා නොගැනීම

(අ) 2023 දෙසැම්බර් 31 දින වන විට විසඳීමට නිබුණු අයදුම්පත් සංඛ්‍යාව 1157 ක් වූ අතර, මේ තුළ ප්‍රධාන කාර්යාලයේ අයදුම්පත් 162 ක්ද, කොළඹ ශාඛාවේ අයදුම්පත් 159 ක් ද, ගම්පහ ශාඛාවේ අයදුම්පත් 383 ක්ද, ගාල්ල හා කුරුණෑගල ශාඛාවල අයදුම්පත් පිළිවෙලින් 212 ක් හා 241 ක් ලෙස 2023 දෙසැම්බර් 31 දින වන විට ඉතිරි වී තිබුණි.

(ආ) 2009 වර්ෂය දක්වා භාර ගන්නා ලද මෙතෙක් නොවිසඳුණු නඩු ගොනු සංඛ්‍යාව 2023 දෙසැම්බර් 31 දින වන විට 12 ක් වී තිබුණු අතර මේ තුළ විමසීම සඳහා කාලය ලබා ගන්නා ලද නඩුගොනු සංඛ්‍යාව 07 ක් විය. ඒ අනුව, වසර 14 කට අධික කාලයක සිට නොවිසඳී පැවත එන නඩුගොනු පවතින බව නිරීක්ෂණය විය.

3.1.2 වාර්ෂික කාර්යසාධන වාර්තාව

2020 අගෝස්තු 28 දිනැති අංක 2/2020 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛයේ 12.1 ඡේදය ප්‍රකාරව වාර්ෂික කාර්යසාධන වාර්තා මුදල් වර්ෂය අවසාන වී දින 150 ක් ගතවීමට පෙර පාර්ලිමේන්තුවේ සභාගත කළයුතු වුවද, 2022 වර්ෂයේ වාර්ෂික කාර්යසාධන වාර්තාව පාර්ලිමේන්තුවේ සභාගත කර තිබුණේ 2023 සැප්තැම්බර් 21 දිනය.

3.2 වත්කම් කළමනාකරණය

මෝටර් රථ දෙකක් සඳහා මිලදී ගන්නා ලද ටයර් වෙනුවෙන් එකතුව රු.188,000 ක බිල්පත්වලට ගෙවීම් කිරීමේදී හා රු.224,000 ක වියදමක් දරා වාහනයකට සිදු කරන ලද අලුත්වැඩියාවට අදාළ බිල්පතට ගෙවීම් කිරීමේදී අදාළ කාර්යයන් නිසි පරිදි ඉටු කර තිබුණු බවට යාන්ත්‍රික ඉංජිනේරුවරයකුගේ නිර්දේශ ලබා ගැනීමකින් තොරව ගෙවීම් කර තිබුණි.

3.3 රජයේ නිලධාරීන් ඇප කැබීම

මුදල් රෙගුලාසි 880 ප්‍රකාරව රජයේ මුදල් ආදායම් මුද්දර හෝ බඩු බාහිරාදිය භාර ගැනීම් හෝ භාරව සිටීම්, එසේ නැතහොත් රජයේ මුදල් බෙදා හැරීම් හෝ මුද්දර නැතහොත් බඩු බාහිරාදිය නිකුත් කිරීම් සම්බන්ධයෙන් පරිපාලනමය වශයෙන් වගකිව යුතු හෝ බලය පැවරීම් යටතේ එම කටයුතු පවරනු ලැබ ඇති හෝ නිලධාරීන්ද, රජයේ ගිණුම්ට අදාළ වවුචර සහතික කරන, වෙක්පත් අත්සන් කරන අයද, ස්වකීය රාජකාරී කටයුතු අවංකව ඉටු කරන බවට 612 වැනි

Scanned with CamScanner

අධිකාරිය වන රජයේ නිලධාරීන්ගේ ඇප ආඥා පනතට හා අධිකරණ අමාත්‍යාංශයේ 2011 ජනවාරි 18 දිනැති අංක 01/2011 දරන චක්‍රලේඛය අනුව ඇප තැබිය යුතු නිලධාරීන් 12 දෙනෙකු ඇප තබා නොතිබුණි.

3.4 **කළමනාකරණ දුර්වලතා**

2022 වර්ෂයේ අගෝස්තු මාසයේ ප්‍රධාන කාර්යාලයේ ද, 2023 නොවැම්බර් මාසයේ ප්‍රධාන කාර්යාලය ඇතුලු සියලුම ශාඛා කාර්යාලවලද නඩුගොනු අතින් ගණන් කර තිබුණු අතර, අතින් ගණන් කිරීමේ දී ලේඛනගත තොරතුරුවලට වඩා 2022 වර්ෂයේ නඩුගොනු 248 කින් ද, 2023 වර්ෂයේ නඩු ගොනු 221 කින් ද, වැඩි වී තිබුණි. ඒ අනුව, 2023 වර්ෂයේ අතින් ගණන් කිරීම නිසා ප්‍රධාන කාර්යාලයේ නඩු ගොනු 83 කින්ද, කොළඹ ශාඛාවේ නඩු ගොනු 48 කින්ද, ගම්පහ ශාඛාවේ නඩු ගොනු 84 කින් ද, වැඩි වීමක් සිදු වී තිබුණි. මෙසේ වරින් වර ගණන් කිරීමේදී ලේඛනගත තොරතුරු හා භෞතික තොරතුරු එකිනෙකට වෙනස් වීම මත ලිපිගොනු නඩත්තුව සඳහා නිසි අභ්‍යන්තර පාලන පද්ධතියක් හඳුන්වාදී නොතිබුණු බව නිරීක්ෂණය විය.

4 **යහපාලනය**

4.1 **අභ්‍යන්තර විගණනය**

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ අංක 40 (1) වගන්තියේ විධිවිධාන ප්‍රකාරව ණය සහනදායක මණ්ඩලයීය දෙපාර්තමේන්තුව අභ්‍යන්තර විගණන ඒකකයක් පිහිටුවා ගැනීමට කටයුතු කර නොතිබුණි.

5. **මානව සම්පත් කළමනාකරණය**

5.1 **අනුයුක්තකාර්ය මණ්ඩලය, තථ්‍ය කාර්ය මණ්ඩලය**

මට්ටම	අනුමත සේවක සංඛ්‍යාව	තථ්‍ය සේවක සංඛ්‍යාව	පුරප්පාඩු/ (අතිරික්ත)
ජ්‍යෙෂ්ඨ මට්ටම	02	01	01
ද්විතික මට්ටම	39	28	11
ප්‍රාථමික මට්ටම	09	09	-
	50	38	12

Scanned with CamScanner

(අ) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආයතන සංග්‍රහයේ II පරිච්ඡේදයේ 13.3 වගන්තිය ප්‍රකාරව වැඩ බැලීමේ පත්වීමක් සිදු කළ යුත්තේ නිත්‍ය පත්වීමක් නරඹන තෙක් තාවකාලික ප්‍රතිකර්මයක් ලෙස වුවද, ජ්‍යෙෂ්ඨ මට්ටම තුළ ඇතුළත් ගණකාධිකාරී තනතුර 2021 මාර්තු 17 වන දින සිට සුරප්පාඩුව පවතින අතර, අමාත්‍යාංශයේ ගණකාධිකාරී විසින් මෙම තනතුරෙහි වැඩ බැලීම සිදු කරනු ලබයි.

(ආ) ද්විතීක මට්ටම තුළ ඇතුළත් සංචර්ධන නිලධාරී තනතුර සඳහා අනුමත සේවක සංඛ්‍යාව 18 ක් වුවද, තථ්‍ය සේවක සංඛ්‍යාව 19 ක් වූයෙන් අතිරික්ත සේවක සංඛ්‍යාව 01 ක් වී නිබුණු අතර, කළමනාකරණ සේවා නිලධාරී තනතුර සඳහා අනුමත සේවක සංඛ්‍යාව 15 ක් වුවද, තථ්‍ය සේවක සංඛ්‍යාව 06 ක් වූයෙන් සුරප්පාඩු 09 ක් පැවතුණි. තවද, ලඝු ලේඛක තනතුර සඳහා අනුමත සේවක සංඛ්‍යාව 06 ක් වුවද, තථ්‍ය සේවක සංඛ්‍යාව 03 ක් වූයෙන් සුරප්පාඩු 03 ක් පැවතුණි.

ආර්.එස්. කටුගම්පල
ජ්‍යෙෂ්ඨ සහකාර විගණකාධිපති
විගණකාධිපති වෙනුවට

Scanned with CamScanner

04 වන පරිච්ඡේදය

4.1 ආයතනයේ කාර්ය සාධන දර්ශක (ක්‍රියාකාරී සැලැස්ම මත පදනම්ව)

විශේෂිත දර්ශක	අපේක්ෂිත නිමැවුම් ප්‍රතිශතයක් (%) ලෙස තත්‍ය නිමැවුම		
	100% - 90%	75% - 89%	50% - 74%
කාර්ය මණ්ඩල අභිප්‍රේරණය	-	75%	-
දෙපාර්තමේන්තුවේ සේවාව සැපයීම හා ලබන ප්‍රචාරණය	-	85	-
දෙපාර්තමේන්තුව විසින් සපයනු ලබන සේවයෙහි ඵලදායිතාවය	-	80%	-

05 වන පරිච්ඡේදය

තිරසාර සංවර්ධනය අරමුණු (SDG) සපුරාගැනීමේ කාර්ය සාධනය

5.1 හඳුනාගන්නා ලද අදාළ තිරසාර සංවර්ධන අරමුණු දක්වන්න.

ඉලක්ක / අරමුණු	ඉලක්ක	ජයග්‍රහණ දර්ශක	මේ දක්වා ජයග්‍රහණ ලබා ගැනීමේ ප්‍රතිශතය		
			0% - 49%	50% -74%	75% - 100%
නිශ්චල දේපල සම්බන්ධයෙන් වූ උකස්කර පොරොන්දු සින්නක්කර හා හුදෙක් ණය ගණුදෙනු සඳහාම ලියන ලද සින්නක්කර ඔප්පු හා අනෙකුත් බැඳීම් කෙරෙහි වූ අයවිය යුතු ණය සම්මුති වලට පාර්ශවයන් පැමිණවීම	ණය සහනදායක මණ්ඩලය විසින් මහජනතාව වෙත සපයනු ලබන සේවාව පුළුල් කිරීම හා ව්‍යාප්ත කිරීම	ණය සහනදායක මණ්ඩලයේ ශාඛා ගම්පහ, කුරුණෑගල හා ගාල්ල දිස්ත්‍රික්ක කේන්ද්‍ර කර ගනිමින් පිහිටුවීම හා කොළඹ දිස්ත්‍රික්කයේද නව ශාඛා මණ්ඩලයක් පිහිටුවීම.			85%

5.2 තිරසාර සංවර්ධන ඉලක්ක සපුරා ගැනීමේ ජයග්‍රහණ හා අභියෝග සැකෙවින් විස්තර කරන්න.

ණය සහනදායක මණ්ඩලයේ ශාඛා මණ්ඩල ගම්පහ, ගාල්ල සහ කොළඹ යන දිස්ත්‍රික්ක කේන්ද්‍ර කරගනිමින් පිහිටුවා පවත්වාගෙන යනු ලැබේ.

06 වන පරිච්ඡේදය

මානව සම්පත් පැතිකඩ

6.1 සේවක සංඛ්‍යා කළමනාකරණය

	අනුමත සේවක සංඛ්‍යාව	පවතින සේවක සංඛ්‍යාව	ඇබෑර්තු (අතිරික්ත)
ජ්‍යෙෂ්ඨ	02	01 01 (වැ.බ.)	01
තෘතියික	-	-	-
ද්විතියික	39	28(06 අනුයුක්ත)	17
ප්‍රාථමික	09	09	00

6.2 ආයතනයේ කාර්ය සාධනය උදෙසා මානව සම්පත් හිඟය හෝ අතිරික්තය බලපානු ලැබ ඇත්තේ කෙසේදැයි කෙටියෙන් සඳහන් කරන්න.

දෙපාර්තමේන්තුවේ සේවාව කාර්යක්ෂමව හා ඵලදායිව මහජනතාව වෙත ලබා දීමට දෙපාර්තමේන්තුව තුළ පවතින සේවක පුරප්පාඩු බෙහෙවින් බලපෑම් සිදුකරනු ලබයි.

මෙම ණය සහනදායක මණ්ඩලයීය දෙපාර්තමේන්තුව තුළ ප්‍රාථමික උසාවියක් ක්‍රියාත්මක බැවින් ඒ සඳහා අත්‍යවශ්‍යම මානව සම්පතක් වන ලඝුලේඛක සේවකයින් 06 දෙනෙක්, දෙපාර්තමේන්තුව සඳහා අනුමත අතර, එම තනතුරු 06 ම වසර කිහිපයක සිට පුරප්පාඩුව පවතී. අධිකරණ, බන්ධනාගාර කටයුතු හා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා ප්‍රතිසංස්කරණ අමාත්‍යාංශය විසින් අනුයුක්ත කරන ලද සේවිකාවන් පමණක් දෙපාර්තමේන්තුව තුළ හා ශාඛා මණ්ඩල තුල සේවය කරන ලදී. දිනකට ණය සහනදායක මණ්ඩලය විසින් නඩු 50ක් පමණ විමසීමට ගනු ලබන අතර, නඩු ගොනුවලට අදාළ පාර්ශවයන්ට පිටපත් නිකුත් කිරීමේදී සිදු වන ප්‍රමාදයන්ට දෙපාර්තමේන්තුවේ ලඝු ලේඛන තනතුරුවල පවතින පුරපපාඩුව බෙහෙවින් බලපෑම් කර ඇත.මේ වන විට මේ සඳහා වන සේවා ව්‍යවස්ථාව අනුමැතිය සඳහා යවා ඇත.

දෙපාර්තමේන්තුව තුළ පවතින විෂයන් ආවරණය කිරීම සඳහා ප්‍රමාණවත් සේවක සංඛ්‍යාවක් නොමැති වීමෙන් එක් සේවකයෙකු වෙත විෂයන් කිහිපයක් ආවරණය කිරීමට සිදුවිය. එහෙයින් දෙපාර්තමේන්තුවේ සේවය කාර්යක්ෂමව සැපයීමට බාධා සිදුවිය.

6.3 මානව සම්පත් සංවර්ධනය

ඒ ඒ විෂය පථයන්ට අදාළව දැනුම හා කුසලතා වර්ධනය කිරීමට උපකාරී වන පුහුණු වැඩසටහන් සඳහා වෙන් කර තිබූ ප්‍රතිපාධන අවම මට්ටමක පැවතීම හේතුවෙන් පුහුණු වැඩසටහන් සඳහා දෙපාර්තමේන්තුවේ සේවක සේවිකාවන් යොමුකිරීමට නොහැකි වූ අතර, දෙවන භාෂා අවශ්‍යතාවය සම්පූර්ණ කිරීමට අවශ්‍ය නිලධාරීන් ඒ සඳහා යොමු කරන ලදී.

07 වන පරිච්ඡේදය

අනුකූලතා වාර්තාව

අංකය	අදාළ කරගත යුතු අවශ්‍යතාවය	අනුකූලතා තත්වය (අනුකූලවේ/ අනුකූල නොවේ)	අනුකූල නොවේ නම් ඒ සඳහා කෙටි පැහැදිලි කිරීම	අනුකූල නොවීම අනාගතයේ දී වළක්වාගැනීමට යෝජනා කරන නිරවද්‍ය තීරණ ක්‍රියාමාර්ග
1	**පහත සඳහන් මූල්‍ය ප්‍රකාශ/ ගිණුම් නියමිත දිනට ඉදිරිපත් කොට තිබේ.**			
1.1	වාර්ෂික මූල්‍ය ප්‍රකාශන	අනුකූල වේ.		
1.2	රාජ්‍ය නිලධාරීන්ගේ අත්තිකාරම් ගිණුම	අනුකූල වේ.		
1.3	ව්‍යාපාර හා නිෂ්පාදන අත්තිකාරකම් ගිණුම් (වාණිජ අත්තිකාරම් ගිණුම්)	අනුකූල නොවේ.		
1.4	ගබඩා අත්තිකාරම්	අනුකූල නොවේ		
1.5	විශේෂ අත්තිකාරම් ගිණුම්	අනුකූල නොවේ.		
1.6	වෙනත්	අනුකූල නොවේ		
2	**පොත්පත් හා ලේඛන නඩත්තු කිරීම (මු.රෙ. 445)**			
2.1	රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 267/2018 අනුව ස්ථාවර වත්කම් ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අනුකූල වේ		
2.2	පුද්ගල පඩිනඩි ලේඛන/ පුද්ගල කාඩ්පත් යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අනුකූල වේ		

2.3	විගණන විමසුම් ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අනුකූල වේ		
2.4	අභ්‍යන්තර විගණන වාර්තා ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අනුකූල නොවේ	මෙම දෙපාර්මේන්තුව තුළ අභ්‍යන්තර විගණන ඒකකයක් නොමැත. අභ්‍යන්තර විගණන කටයුතු අධිකරණ අමාත්‍යාංශයේ අභ්‍යන්තර විගණන ඒකකය මඟින් සිදු කරනු ලබයි.	
2.5;	සියළුම මාසික ගිණුම් සාරංශ (CIGAS) පිළියෙල කර නියමිත දිනට මහා භාණ්ඩාගාරයට ඉදිරිපත් කිරීම	අනුකූල වේ		
2.6	චෙක්පත් හා මුදල් ඇණවුම් ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අනුකූල වේ		
2.7	ඉන්වෙන්ට්‍රි ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අනුකූල වේ		
2.8	තොග ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අනුකූල වේ		
2.9	හානි පාඩු ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අනුකූල වේ		
2.10	බැරකම් ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අනුකූල වේ		
2.11	උප පත්‍රිකා පොත් ලේඛනය (GA- N20) යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අනුකූල වේ		

3	**මූල්‍ය පාලනය සඳහා කාර්යයන් අභිනියෝජනය කිරීම (මු.රෙ. 135)**			
3.1	මූල්‍ය බලතල ආයතනය තුළ පවරාදී තිබීම	අනුකූල වේ		
3.2	මූල්‍ය බලතල පවරාදීම පිළිබඳ ආයතනය තුළ දැනුවත් කර තිබීම.	අනුකූල වේ		
3.3	සෑම ගණුදෙනුවක්ම නිලධාරීන් දෙදෙනෙකු හෝ ඊට වැඩි සංඛ්‍යාවක් හරහා අනුමත වන පරිදි බලතල පවරාදී තිබීම	අනුකූල වේ		
3.4	2014.05.11 දිනැති අංක 171/2004 දරණ රාජ්‍ය ගිණුම් චක්‍රලේඛය අනුව රජයේ පඩිපත් මෘදුකාංග පැකේජය භාවිතා කිරීමේදි ගණකාධිකාරිවරයන්ගේ පාලනයට යටත්ව කටයුතු කිරීම.	අනුකූල වේ.	.	
4	**වාර්ෂික සැලැසුම් සකස් කිරීම**			
4.1	වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම සකස් කිරීම	අනුකූල වේ		
4.2	වාර්ෂික ප්‍රසම්පාදන සැලැස්ම සකස් කිරීම	අනුකූල වේ		
4.3	වාර්ෂික අභ්‍යන්තර විගණන සැලැස්ම සකස් කිරීම	අනුකූල වේ	මෙම දෙපාර්මේන්තුව තුළ අභ්‍යන්තර විගණන ඒකකයක් නොමැත. අභ්‍යන්තර විගණන කටයුතු අධිකරණ අමාත්‍යාංශයේ අභ්‍යන්තර විගණන	

			ඒකකය මඟින් සිදු කරනු ලබයි.	
4.4	වාර්ෂික ඇස්තමේන්තුව සකස් කොට ජාතික අයවැය දෙපාර්තමේන්තුවට (NDB) නියමිත දිනට ඉදිරිපත් කිරීම.	අනුකූල වේ		
4.5	වාර්ෂික මුදල් ප්‍රවාහන ප්‍රකාශය නියමිත දිනට භාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්තමේන්තුවට ඉදිරිපත් කර තිබීම	අනුකූල වේ		
5	**විගණන විමසුම**			
5.1	විගණකාධිපතිවරයා විසින් නියම කොට ඇති දිනට සියලුම විගණන විමසුම්වලට පිළිතුරු දී තිබීම.	අනුකූල වේ		
6	**අභ්‍යන්තර විගණනය**			
6.1	මු.රෙ 134 (2) DMA/1 2019 අනුව වසර ආරම්භයේදී විගණකාධිපතිවරයා සමඟ සාකච්ඡා කිරීමෙන් අනතුරුව අභ්‍යන්තර විගණන සැලැස්ම සකස් කිරීම	අනුකූල නොවේ	මෙම දෙපාර්තමේන්තුවේ අභ්‍යන්තර විගණන ඒකකයක් නොමැති අතර අධිකරණ අමාත්‍යාංශයෙන් අභ්‍යන්තර විගණන කටයුතු සිදු කරනු ලබයි	
6.2	සෑම අභ්‍යන්තර විගණන වාර්තාවකටම මාසයක කාලයක් තුළදී පිළිතුරු සපයා තිබීම	අනුකූල වේ		
6.3	2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 40(4) උප වගන්තිය ප්‍රකාරව සියලුම අභ්‍යන්තර විගණන වාර්තාවල පිටපත්	අනුකූල නොවේ	මෙම දෙපාර්තමේන්තුවේ අභ්‍යන්තර විගණන ඒකකයක් නොමැති අතර අධිකරණ	

	කළමනාකරණ විගණන දෙපාර්තමේන්තුවට ඉදිරිපත් කර තිබීම.		අමාත්‍යාංශයේ අභ්‍යන්තර විගණන අංශයෙන් අභ්‍යන්තර විගණන කටයුතු කරනු ලබයි.	
6.4	මුදල් රෙගුලාසි 134 (3) ප්‍රකාරව සියලුම අභ්‍යන්තර විගණන වාර්තාවල පිටපත් විගණකාධිකරවරයාට ඉදිරිපත් කිරීම.	අනුකූල නොවේ.	මෙම දෙපාර්තමේන්තුවේ අභ්‍යන්තර විගණන ඒකකයක් නොමැති අතර අධිකරණ අමාත්‍යාංශයේ අභ්‍යන්තර විගණන අංශයෙන් අභ්‍යන්තර විගණන කටයුතු සිදු කරනු ලබයි	
7	**විගණන හා කළමනාකරණ කමිටු**			
7.1	DMA චක්‍රලේඛ 1-2019 අනුව අවම වශයෙන් විගණන හා කළමනාකරණ කමිටු 04 ක්වත් අදාළ වර්ෂය තුළ පවත්වාගෙන තිබීම.	අනුකූල වේ.		
	වත්කම් කළමනාකරණය			
8.1	අංක 01/2017 දරණ වත්කම් කළමනාකරණ චක්‍ර ලේඛයේ 07වන පරිච්ඡේදය අනුව වත්කම් මිලදි ගැනීම් හා අපහරණය කිරීම් පිළිබඳ තොරතුරු කොම්ප්ට්‍රෝලර් ජනරාල් කාර්යාලය වෙත ඉදිරිපත් කර තිබීම.	අනුකූල වේ.		
8.2	ඉහත සඳහන් චක්‍ර ලේඛයේ 13 වන පරිච්ඡේදය ප්‍රකාරව, එම චක්‍රලේඛයේ විධිවිධාන	අනුකූල වේ		

	ක්‍රියාත්මක කිරීම සම්බන්ධීකරණ සඳහා සුදුසු සම්බන්ධතා නිලධාරියෙකු පත්කර එම නිලධාරියා පිළිබඳ තොරතුරු කොම්ප්ට්‍රෝලර් ජනරාල් කාර්යාලයට වාර්තාකර තිබීම.			
8.3	රාජ්‍ය මුදල් චක්‍රලේඛ අංක 05/2016 අනුව භාණ්ඩ සමීක්ෂණ පවත්වා අදාළ වාර්තා නියමිත දිනට විගණකාධිපතිවරයා වෙත ඉදිරිපත් කර තිබීම.	අනුකූල වේ.		
8.4	වාර්ෂික භාණ්ඩ සමීක්ෂණයෙන් අනාවරණය වූ අතිරික්තය, ඌණතා හා වෙනත් නිර්දේශ චක්‍රලේඛයේ සඳහන් කාලය තුළ සිදුකොට තිබීම.	අනුකූල වේ.		
8.5	ගර්හිත භාණ්ඩ අපහරණය කිරීම මු.රෙ 772 අනුව සිදු කිරීම	අනුකූල වේ		
9	**වාහන කළමනාකරණය**			
9.1	සංචිත වාහන සඳහා දෛනික ධාවන සටහන් හා මාසික සාරංශ වාර්තා සකස් කොට නියමිත විගණකාධිපති වෙත ඉදිරිපත් කිරීම.	අනුකූල වේ.		
9.2	වාහන ගර්හිත වී මාස 06 කට වඩා අඩු කාලයකදි අපහරණය කර තිබීම	අනුකූල නොවේ		
9.3	වාහන ලෝග් පොත පවත්වාගනිමින් ඒවා	අනුකූල වේ		

	යාවත්කාලීන කර පවත්වාගෙන යාම			
9.4	සෑම වාහන අනතුරක් සම්බන්ධයෙන්ම මු. රෙ 103, 104,109 හා 110 ප්‍රකාරව කටයුතු කිරීම.	අනුකූල වේ.		
9.5	2016.12.29 දිනැති අංක 2016/30 දරණ රාජ්‍ය පරිපාලන චක්‍ර ලේඛයේ 3.1 ඡේදයේ සඳහන් විධි විධාන ප්‍රකාරව, වාහනවල ඉන්ධන දහනය වීම, නැවත පරීක්ෂා කිරීම.	අනුකූල වේ		
9.6	කල්බදු කාලසීමාවෙන් අනතුරුව, බදු වාහනවල ලොග් පොත්වල සම්පූර්යෙන්ම අයිතිය පවරා ගෙන තිබීම	අනුකූල වේ.		
10	**බැංකු ගිණුම් කළමනාකරණය**			
10.1	නියමිත දිනට බැංකු සැසඳුම් ප්‍රකාශ පිළියෙල කර සහතික කර ඒවා විගණනය සඳහා ඉදිරිපත් කර තිබීම.	අනුකූල වේ.		
10.2	සමාලෝචිත වර්ෂයේදී හෝ ඊට පෙර වර්ෂවල සිට ඉදිරියට රැගෙන ආ අක්‍රීය බැංකු ගිණුම් නිරවුල් කර තිබීම.	අනුකූල වේ.		
10.3	බැංකු සැසඳුම් ප්‍රකාශවලින් අනාවරණය වූ හා ගැළපුම් කළ යුතුව තිබූ ශේෂ සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කොට එම ශේෂ මාසයක	අනුකූල වේ.		

	කාලයක් ඇතුළත නිරවුල් කර තිබීම			
11	**ප්‍රතිපාදන උපයෝජනය**			
11.1	සලසා තිබූ ප්‍රතිපාදන ඒවායේ සීමාව ඉක්මවා නොයන පරිදි වියදම් දැරීම	අනුකූල වේ.		
11.2	මු.රෙ 94 (1) ප්‍රකාරව සලසන ලද ප්‍රතිපාදනයෙන් උපයෝජනය කළ පසු වර්ෂ අවසානයේ දී ඉතිරි ප්‍රතිපාදන සීමාව නොඉක්මවන පරිදි බැරකම්වල පරිදි බැරකම්වලට එළැඹීම	අනුකූල නොවේ.		
12	**රජයේ නිලධාරින්ගේ අත්තිකාරම් ගිණුම්**			
12.1	සීමාවන්වලට අනුකූල වීම	අනුකූල වේ.		
12.2	හිඟහිටි ණය ශේෂ පිළිබඳ කාල විශ්ලේෂණය සිදු කර තිබීම.	අනුකූල වේ.		
12.3	වර්ෂයකට වැඩි කාලයක සිට පැවත එන හිඟහිටි ණය ශේෂ නිරවුල් කර තිබීම.	අනුකූල වේ.		
13	**පොදු තැන්පත් ගිණුම**			
13.1	කල් ඉකුත් වූ තැන්පත් සම්බන්ධයෙන් මු.රෙ 571 ප්‍රකාරව කටයුතු කර තිබීම.	අනුකූල වේ.		
13.2	පොදු තැන්පතු සඳහා වන පාලන ගිණුම යාවත්කාලීන කර පවත්වාගෙන යාම.	අනුකූල වේ.		
14	**අග්‍රිම ගිණුම**			
14.1	සමාලෝචිත වර්ෂය අවසානයේදි මුදල් පොතේ ශේෂය භාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්තමේන්තුවට ප්‍රේෂණය කර තිබීම.	අනුකූල වේ.		

14.2	මු.රෙ 371 ප්‍රකාරව නිකුත් කළ තත්කාර්ය අතුරු අග්‍රිම, එම කාර්යය අවසන් වී මාසයක් ඇතුළත නිරවුල් කර තිබීම.	අනුකූල වේ.		
14.3	මු.රෙ 371 ප්‍රකාරව අනුමත සීමාව ඉක්මවා නොයන පරිදි තත්කාර්ය අතුරු අග්‍රිම නිකුත් කර තිබීම.	අනුකූල වේ.		
14.4	අග්‍රිම ගිණුමේ ශේෂය භාණ්ඩාගාරයේ පොත් සමඟ මාසිකව සැසඳුම් කිරීම	අනුකූල වේ.		
15	**ආදායම් ගිණුම්**			
15.1	අදාළ රෙගුලාසිවලට අනුකූලව රැස් කළ ආදායමෙන් ආපසු ගෙවීම් සිදුකොට තිබීම	අනුකූල වේ.		
15.2	රැස්කර තිබූ ආදායම් තැන්පතු ගිණුමට බැර නොකොට සෘජුවම ආදායමට බැර කර තිබීම.	අනුකූල වේ.		
15.3	මු.රෙ 176 අනුව හිඟ ආදායම් වාර්තා විගණකාධිපතිවරයා වෙත ඉදිරිපත් කර තිබීම.	අනුකූල වේ.		
16	**මානව සම්පත් කළමනාකරණය**			
16.1	අනුමත කාර්ය මණ්ඩල සීමාව තුළ පවතාවගෙන යාම	අනුකූල වේ.		
16.2	කාර්ය මණ්ඩලයේ සියලුම සාමාජිකයන් වෙත රාජකාරි ලැයිස්තු ලිඛිතව ලබාදී තිබීම.	අනුකූල වේ.		
16.3	20.09.2017 දිනැති MSD චක්‍ර ලේඛ අංක 04/2017	අනුකූල වේ.		

	ප්‍රකාරව සියලුම වාර්තා කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව වෙත ඉදිරිපත් කර තිබීම.			
17	**මහජනයා වෙත තොරතුරු ලබාදීම**			
17.1	තොරතුරු දැනගැනීමේ පනත හා රෙගුලාසි ප්‍රකාරව තොරතුරු නිලාධාරියෙකු පත් කොට තොරතුරු ලබාදීමේ ලේඛනයක් යාවත්කාලීන කර පවත්වාගෙන යාම.	අනුකූල වේ.	දෙපාර්තමේන්තුව සඳහා වෙබ් අඩවියක් නොමැති අතර, අධිකරණ අමාත්‍යාංශයේ වෙබ් අඩවියේ මෙම දෙපාර්තමේන්තුව පිළිබඳ තොරතුරු සඳහන් වේ.	
17.3	තොරතුරු දැනගැනීමේ පනතේ 08 වන හා 10 වන වගන්ති ප්‍රකාරව වසරකට දෙවතාවක් හෝ වසරකට වරක් වාර්තා ඉදිරිපත් කර තිබීම.	අනුකූල වේ.		
18	**පුරවැසි ප්‍රඥප්තිය ක්‍රියාත්මක කිරීම**			
18.1	අංක 05/ 2008 හා 05/ 2018 (1) දරණ රාජ්‍ය පරිපාලන හා කළමනාකරණ අමාත්‍යාංශ චක්‍ර ලේඛ අනුව පුරවැසි/ සේවාලාභී ප්‍රඥප්තියක් සම්පාදනය කොට ක්‍රියාත්මක කර තිබීම.	අනුකූල වේ.		
18.2	එම චක්‍ර ලේඛයේ 2.3 ඡේදය පරිදි, පුරවැසි/ සේවාලාභී ප්‍රඥප්තිය සම්පාදනය කිරීම හා ක්‍රියාත්මක කිරීමේ කටයුතු අධීක්ෂණය කිරීම හා ඇගයීම සඳහා ආයතන	අනුකූල වේ		

	විසින් ක්‍රමවේදයක් සකස් කොට තිබීම			
19	**මානව සම්පත් සම්පාදනය**			
19.1	2018.01.24 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍ර ලේඛ අංක 02/ 2018 ඇමුණුම 02 ආකෘතිය පදනම් කරගෙන මානව සම්පත් සැලැස්මක් සකස් කොට තිබීම	අනුකූල වේ		
19.2	කාර්ය මණ්ඩලයේ සෑම සාමාජිකයෙකු සඳහාම වර්ෂයකට අවම වශයෙන් පැය 12 කට නොඅඩු පුහුණු අවස්ථාවක ඉහත සඳහන් මානව සම්පත් සැලැස්ම තුළ තහවුරු කොට තිබීම.	අනුකූල වේ.		
19.3	ඉහත සඳහන් චක්‍රලේඛයේ ඇමුණුම 01 හි දැක්වෙන ආකෘතිය පදනම් කරගෙන සමස්ත කාර්ය මණ්ඩලය සඳහාම වාර්ෂික ගිවිසුම් අත්සන් කර තිබීම.	අනුකූල වේ.		
19.4	ඉහත චක්‍රලේඛයේ 6.5 ඡේදය ප්‍රකාරව මානව සම්පත් සංවර්ධන සැලැස්ම පිළියෙළ කිරීම, ධාරිතා සංවර්ධන වැඩසටහන් සංවර්ධනය කිරීම, නිපුණතා සංවර්ධන වැඩසටහක් ක්‍රියාත්මක කිරීම පිළිබඳ වගකීම් පවරා ජ්‍යෙෂ්ඨ නිලධාරියෙකු පත් කොට තිබීම.	අනුකූල වේ		
20	**විගණන ඡේදවලට ප්‍රතිචාර දැක්වීම**			

20.1	ඉකුත් වර්ෂ සඳහා විගණකාධිපති විසින් නිකුත් කළ විගණන ඡේද මඟින් පෙන්වා දී ඇති අඩුපාඩු නිවැරදි කොට තිබීම.	අනුකූල වේ.		